WORKED.


# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,634—1959 ජනවාරි 2 වැනි සිකුරාදා—2.1.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1959 අංක 10**

අ.ආ.කා. අංකය : C. 218/56 (II).

ස්වදේශ කටයුතු භාර ඇමති තැන්පත් ගරු ඒ. පී. ජයසූරිය සෙනෙව් මන්ත්‍රීතුමා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 49 (3) වැනි වගන්තිය යටතේ, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්, මහානාම සමරවීර පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1958වේ දෙසැම්බර මස 31 වැනි දින සිට, ස්වදේශ කටයුතු භාර ඇමති වශයෙන් වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, පත් කළ බව මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1958 දෙසැම්බර මස 31 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

## මිල පාලන දැන්වීම්

**ආර්./16/1958 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය.** **කරවල සහ වියළි ඉස්සෝ**

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් මෙතියස් ස්ටීවන් ක්ලීටස් ගුණවර්ධන වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) අංක 11,612 හා 1958 දෙසැම්බර් මස 10 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක ආර්/15/1958 හා 1958 දෙසැම්බර් මස 5 වෙනි දින දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙයින් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති පළමුවෙනි උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් වර්ගවලට අයත් කරවල සහ වියළි ඉස්සන් තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී ශුද්ධබර හොණ්ඩරයක් මේ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, මෙහිම 3වෙනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මීට යාකර ඇති දෙවෙනි උපලේඛනයේ 2වෙනි තීරයෙහි සඳහන් වර්ගවලට අයත් කරවල සහ වියළි ඉස්සන් සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක්, මේ උපලේඛනයෙහි 1වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, මෙහිම 3වෙනි තීරයේ අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) කරවල හෝ වියළි ඉස්සන් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ කරවල හෝ වියළි ඉස්සන් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත්,

(ආ) කරවල හෝ වියළි ඉස්සන් නැවත විකිණීම සඳහා හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකන බවත්,

(ඇ) කරවල හෝ වියළි ඉස්සන් තොග වශයෙන් විකිණීමට පුරුදුව සිටින කවරෙකු හෝ තොග වෙළෙන්දෙකු ලෙස සළකන බවත්,

(ඈ) "ශුද්ධ බර හොණ්ඩරයක තොග වශයෙන් වැඩිම මිළ" සියලුම තොග විකිණීම් සඳහා බලපවත්වන බවත්,

(ඉ) "සිල්ලර වශයෙන් විකිණීමේ දී වැඩිම මිළ" සියලුම සිල්ලර විකිණීම් සඳහා බලපවත්වන බවත්,

(ඊ) "වේලන ලද මාළු" සහ "කරවල" එක සේ සළකන බවත්,

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සැම ප්‍රදේශයකම පළමුවන උපලේඛනයේ 2 වෙනි තීරයේ සහ දෙවෙනි උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත් නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සැම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක පළමුවෙනි උපලේඛනයේ 2 වෙනි තීරයේ සහ දෙවෙනි උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් කරවල හෝ වියළි ඉස්සන් තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සැම වෙළෙන්දෙකුම එම ප්‍රදේශය සඳහා ඒ ද්‍රව්‍ය සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් සටහන් කරනලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා." යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සැම ප්‍රදේශයකම, පළමුවෙනි උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් තොග වශයෙන් විකුණන සැම තැනැත්තෙකු හා දෙවෙනි උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් කරවල සහ වියළි ඉස්සන් සිල්ලර වශයෙන් විකුණන සැම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ ද්‍රව්‍යයේ විස්තර ;

(ඇ) විකුණූ ප්‍රමාණය (දල බර හා ශුද්ධ බර) ;

(ඈ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඉ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දියයුතු බවද නියම කරමි.

(9) පළමුවෙනි හා දෙවෙනි උපලේඛනවල 2 වෙනි තීරයන්හි සඳහන් කරවල සහ වියළි ඉස්සන් විකුණනවිට, ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත්, එම උපලේඛනවල 3 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් වල ඇතුළත් වන බවද නියම කරමි.

(10) තවද, කුම්බිලා, බොම්බිලි, හාල්මැස්සන් සහ වියළි ඉස්සන් හැර උපලේඛනවල 2 වෙනි තීරයේ සඳහන් වෙනත් කරවල කිසිවක බහා විකුණනවිට එම කරවල බහා ඇති එක එක භාණ්ඩය උදෙසා දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් දහය බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(11) උපලේඛනවල 2වෙනි තීරයේ සඳහන් කුම්බලාවුන් කිසිවක බහා විකුණන විට, ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විසිපහ බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(12) උපලේඛනවල 2 වෙනි තීරයේ සඳහන් බොම්බිලි කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දල බරින් තාර බර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් අට බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(13) උපලේඛනවල 2 වෙනි තීරයේ සඳහන් හාල්මැස්සන් කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් විස්ස බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(14) උපලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් වියළි ඉස්සන් ලෙලි රහිතව හෝ සහිතව කිසිවක බහා විකුණන විට ඒ බහා ඇති එක එක භාණ්ඩය සඳහා, දල බරින් තාර බර ලෙස අඩුම වශයෙන් රාත්තල් පහලොව බැගින් අඩුකොට ඉතිරි බර අනුව විකුණන මිළ ගණන් ගතයුතු බවද,

(15) මෙම නියෝගය සඳහා "ශුද්ධ" යන්නෙන් හැඟවෙන්නේ දල බරින් තාර බර අඩුකොට ඉතිරිවන බර හෝ කරවල නැතහොත් වියළි ඉස්සන්ගේ පමණක් බර බවද නියම කරමි.

1958 දෙසැම්බර් මස 27 වෙනි දින පෙරවරු 10ට රත්නපුර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ඇම්. ඇස්. සී. ගුණවර්ධන,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන.

## පළමුවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තර | 3 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. (අ) රත්නපුර පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය; (ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරළේ පල්ලේ පත්තුව; (ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදෑනි වසම් හැර කුරුවිටි කෝරළේ උඩ පත්තුව සහ කරඳන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදෑනි වසම් | හිස රහිත තෝර ... ... | 117 50 |
| | හිස සහිත තෝර ... ... | 99 0 |
| | හිස රහිත කට්ටා ... ... | 87 0 |
| | කට්ටා සම්පූර්ණයෙන් ... ... | 67 0 |
| | හිස සහිත අන්ජිලා ... ... | 61 0 |
| | හිස රහිත අන්ජිලා ... ... | 65 0 |
| | හිස රහිත පරව් ... ... | 97 0 |
| | හිස සහිත පරව් ... ... | 79 0 |
| | හිස රහිත කොඩුවා ... ... | 87 0 |
| | හිස සහිත කොඩුවා ... ... | 63 81 |
| | බලයා ... ... ... | 87 0 |
| | තොන්ඩ ... ... ... | 67 0 |
| | කුම්බිලා ... ... ... | 29 50 |
| | බොම්බිලි ... ... | 79 0 |
| | හාල්මැස්සෝ ... ... | 75 0 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 117 50 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 93 0 |

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තර | 3 වෙනි තීරය<br>තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 2. කලටුවාව නැගෙනහිර ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ පල්ලේ පත්තුව සහ කරඳන ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ මැද පත්තුව | හිස රහිත තෝර ... ... | 117 25 |
| | හිස සහිත තෝර ... ... | 98 75 |
| | හිස රහිත කට්ටා ... ... | 86 75 |
| | කට්ටා සම්පූර්ණයෙන් ... ... | 66 75 |
| | හිස සහිත අන්ජීලා ... ... | 60 75 |
| | හිස රහිත අන්ජීලා ... ... | 64 75 |
| | හිස රහිත පරව් ... ... | 96 75 |
| | හිස සහිත පරව් ... ... | 78 75 |
| | හිස රහිත කොඩුවා ... ... | 86 75 |
| | හිස සහිත කොඩුවා ... ... | 63 56 |
| | බලයා ... ... ... | 86 75 |
| | තොන්ඩ ... ... ... | 66 75 |
| | කුම්බිලා ... ... ... | 29 25 |
| | බොම්බිලි ... ... | 78 75 |
| | හාල්මැස්සෝ ... ... | 74 75 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 117 25 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 92 75 |
| 3. (අ) නවදුන් කෝරළේ උඩ පත්තුව, මැද පත්තුව සහ පල්ලේ පත්තුව (ආ) කුකුළු කෝරළේ මැද පත්තුව | හිස රහිත තෝර ... ... | 117 65 |
| | හිස සහිත තෝර ... ... | 99 15 |
| | හිස රහිත කට්ටා ... ... | 87 15 |
| | කට්ටා සම්පූර්ණයෙන් ... ... | 67 15 |
| | හිස සහිත අන්ජීලා ... ... | 61 15 |
| | හිස රහිත අන්ජීලා ... ... | 65 15 |
| | හිස රහිත පරව් ... ... | 97 15 |
| | හිස සහිත පරව් ... ... | 79 15 |
| | හිස රහිත කොඩුවා ... ... | 87 15 |
| | හිස සහිත කොඩුවා ... ... | 63 96 |
| | බලයා ... ... ... | 87 15 |
| | තොන්ඩ ... ... ... | 67 15 |
| | කුම්බිලා ... ... ... | 29 65 |
| | බොම්බිලි ... ... | 79 15 |
| | හාල්මැස්සෝ ... ... | 75 15 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 117 65 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 93 15 |
| 4. (අ) බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය; (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය ; (ඇ) කුරුවිටි කෝරළේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනි වසම්; (ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරළේ හෙල පල්ලේ පළාත, හෙල උඩ පළාත සහ උඩුවග්ගම් පත්තුව; (ඉ) අටකලං කෝරළේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම; (ඊ) කුකුළු කෝරළේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම්මුලාදැනි වසම | හිස රහිත තෝර ... ... | 117 75 |
| | හිස සහිත තෝර ... ... | 99 25 |
| | හිස රහිත කට්ටා ... ... | 87 25 |
| | කට්ටා සම්පූර්ණයෙන් ... ... | 67 25 |
| | හිස සහිත අන්ජීලා ... ... | 61 25 |
| | හිස රහිත අන්ජීලා ... ... | 65 25 |
| | හිස රහිත පරව් ... ... | 97 25 |
| | හිස සහිත පරව් ... ... | 79 25 |
| | හිස රහිත කොඩුවා ... ... | 87 25 |
| | හිස සහිත කොඩුවා ... ... | 64 06 |
| | බලයා ... ... ... | 87 25 |
| | තොන්ඩ ... ... ... | 67 25 |
| | කුම්බිලා ... ... ... | 29 75 |
| | බොම්බිලි ... ... | 79 25 |
| | හාල්මැස්සෝ ... ... | 75 25 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 117 75 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 93 25 |
| 5. (අ) කොළොන්නා කෝරළේ කොළොන්නාගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව; (ආ) කඩවත කෝරළේ තල්පිටිගම් පත්තුව; (ඇ) අටකලං කෝරළේ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම හැර දෙපත්තුව , (ඈ) මැද කෝරළේ කල්තොට වසම | හිස රහිත තෝර ... ... | 118 00 |
| | හිස සහිත තෝර ... ... | 99 50 |
| | හිස රහිත කට්ටා ... ... | 87 50 |
| | කට්ටා සම්පූර්ණයෙන් ... ... | 67 50 |
| | හිස සහිත අන්ජීලා ... ... | 61 50 |
| | හිස රහිත අන්ජීලා ... ... | 65 50 |
| | හිස රහිත පරව් ... ... | 97 50 |
| | හිස සහිත පරව් ... ... | 79 50 |
| | හිස රහිත කොඩුවා ... ... | 87 50 |
| | හිස සහිත කොඩුවා ... ... | 64 31 |
| | බලයා ... ... ... | 87 50 |
| | තොන්ඩ ... ... ... | 67 50 |
| | කුම්බිලා ... ... ... | 30 00 |
| | බොම්බිලි ... ... | 79 50 |
| | හාල්මැස්සෝ ... ... | 75 50 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 118 00 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 93 50 |

## දෙවෙනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය<br>විස්තර | 3 වෙනි තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. (අ) රත්නපුර පළාත් ආණ්ඩු සහා ප්‍රදේශය ; (ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරළේ පල්ලේ පත්තුව ; (ඇ) එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනි වසම් හැර කුරුවිටි කෝරළේ උඩ පත්තුව සහ කරඳන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදැනි වසම් | තෝර ... ... ... | 1 25 |
| | කට්ටා ... ... ... | 0 89 |
| | අන්ජිලා ... ... ... | 0 72 |
| | පරව් ... ... ... | 1 02 |
| | කොඩුවා ... ... ... | 0 87 |
| | බලයා ... ... ... | 0 97 |
| | තොන්ඩ ... ... ... | 0 72 |
| | කුම්බිලා ... ... ... | 0 32 |
| | බොම්බිලි... ... ... | 0 92 |
| | හාල්මැස්සෝ ... ... | 0 87 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 1 12 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 0 87 |
| 2. කලටුවාව නැගෙනහිර ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ පල්ලෙ පත්තුව සහ කරඳන ගම්මුලාදැනි වසම හැර කුරුවිටි කෝරළේ මැද පත්තුව | තෝර ... ... ... | 1 24 |
| | කට්ටා ... ... ... | 0 88 |
| | අන්ජිලා ... ... ... | 0 71 |
| | පරව් ... ... ... | 1 01 |
| | කොඩුවා ... ... ... | 0 86 |
| | බලයා ... ... ... | 0 96 |
| | තොන්ඩ ... ... ... | 0 71 |
| | කුම්බිලා ... ... ... | 0 31 |
| | බොම්බිලි ... ... | 0 91 |
| | හාල්මැස්සෝ ... ... | 0 86 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 1 11 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 0 86 |
| 3. (අ) නවදුන් කෝරළේ උඩපත්තුව, මැදපත්තුව සහ පල්ලේ පත්තුව (ආ) කකුළු කෝරළේ මැද පත්තුව | තෝර ... ... ... | 1 26 |
| | කට්ටා ... ... ... | 0 90 |
| | අන්ජිලා ... ... ... | 0 73 |
| | පරව් ... ... ... | 1 03 |
| | කොඩුවා ... ... ... | 0 88 |
| | බලයා ... ... ... | 0 98 |
| | තොන්ඩ ... ... ... | 0 73 |
| | කුම්බිලා ... ... ... | 0 33 |
| | බොම්බිලි... ... ... | 0 93 |
| | හාල්මැස්සෝ ... ... | 0 88 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 1 13 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 0 88 |
| 4. (අ) බලන්ගොඩ පළාත් ආණ්ඩු සහා ප්‍රදේශය; (ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය; (ඇ) කුරුවිටි කෝරළේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදැනි වසම්; (ඈ) කල්තොට වසම හැර කඩවත මැද කෝරළේ හෙල පල්ලේ පළාත, හෙල උඩ පළාත සහ උඩුවග්ගම් පත්තුව (ඉ) අටකලං කෝරලේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම; (ඊ) කුකුළු කෝරලේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම්මුලාදැනි වසම | තෝර ... ... ... | 1 27 |
| | කට්ටා ... ... ... | 0 91 |
| | අන්ජිලා ... ... ... | 0 74 |
| | පරව් ... ... ... | 1 04 |
| | කොඩුවා ... ... ... | 0 89 |
| | බලයා ... ... ... | 0 99 |
| | තොන්ඩ ... ... ... | 0 74 |
| | කුම්බිලා ... ... ... | 0 34 |
| | බොම්බිලි... ... ... | 0 94 |
| | හාල්මැස්සෝ ... ... | 0 89 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 1 14 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 0 89 |
| 5. (අ) කොළොන්නා කෝරළේ කොළොන්නාගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව; (ආ) කඩවත කෝරළේ තල්පිටිගම් පත්තුව; (ඇ) අටකලං කෝරළේ පල්ලේ බැද්ද ගම්මුලාදැනි වසම හැර දෙපත්තුව; (ඈ) මැද කෝරළේ කල්තොට වසම | තෝර ... ... ... | 1 28 |
| | කට්ටා ... ... ... | 0 92 |
| | අන්ජිලා ... ... ... | 0 75 |
| | පරව් ... ... ... | 1 05 |
| | කොඩුවා ... ... ... | 0 90 |
| | බලයා ... ... ... | 1 0 |
| | තොන්ඩ ... ... ... | 0 75 |
| | කුම්බිලා ... ... ... | 0 35 |
| | බොම්බිලි... ... ... | 0 95 |
| | හාල්මැස්සෝ ... ... | 0 90 |
| | ලෙලි රහිත වියළි ඉස්සෝ ... | 1 15 |
| | ලෙලි සහිත වියළි ඉස්සෝ ... | 0 90 |

**සැළකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. එම මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී